ඒ දෙක අතහරින්න. සැබැවින්ම මම ඒ දෙක පිරිසිදු තත්ත්වයේ පැළඳ ඇත්තෙමි

අල් මුගීරා (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලදී. එතුමා මෙසේ පැවසීය: “මම නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් සමග ගමනක නිරතව සිටියෙමි. එවිට එතුමාගේ හමින් සාදන ලද පාවහන් දෙක ගලවන්නට බැස්සෙමි. එවිට එතුමාණෝ: "ඒ දෙක අතහරින්න. සැබැවින්ම මම ඒ දෙක පිරිසිදු තත්ත්වයේ පැළඳ ඇත්තෙමි" යැයි පවසා පසුව එතුමා ඒ දෙක මත පිරිමැද්දාහ.
[صحيح] [متفق عليه]

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ තම එක් ගමනක වුළූ ධෝවනය කළහ. නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් දෙපා සේදීමට ගිය විට, මුගීරා ඉබ්නු ෂුඃබා (රළියල්ලාහු අන්හු) තුමාණන් එතුමාණන්ගේ දෙපා සෝදා ගැනීම සඳහා එතුමාණන් පැළඳ සිටි හමින් සාදන ලද පාවහන් දෙක ගැලවීමට තම දෑත් දිගු කළේය. එවිට නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ: ඒ දෙක අත්හරින්න. ඒ දෙක ගළවන්න එපා. සැබැවින්ම මාගේ දෙපා මා ඒ දෙක තුළට ඇතුළු කළේ පිරිසිදු තත්ත්වයේ සිටිය දීය යැයි පවසා සිටියහ. පසුව නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් තම දෙපා සේදීම වෙනුවට හමින් සාදන ලද එතුමාණන්ගේ පාවහන් දෙක මත ජලයෙන් පිරිමැද්දහ.

https://sunnah.global/hadeeth/si/show/3014